Nestlé Good food, Good life

# මාධ්‍ය නිවේදනය

2022 මැයි 9, කොළඹදී

## නෙස්ලේ ලංකාහි සමරිඳු සහ මිනිඳු 2022 'Cannes Lions Young Marketer' තරඟය ජයගනිති

*'Cannes Lions International Festival of Creativity' හිදී ශ්‍රී ලංකාව නියෝජනය කිරීමේ වරම් ද හිමිකරගනිති*

පසුගියදා පැවැති '2022 Cannes Lions Young Marketer' තරඟය ජයග්‍රහණය කිරීමට නෙස්ලේ ලංකා සමාගමේ සමරිඳු විතාරණ සහ මිනිඳු අලස් සමත්වූහ. මෙම දේශීය තරඟය ජයග්‍රහණය කිරීමත් සමඟ ඔවුන් දෙදෙනා ජූනි මාසයේදී පැවැත්වෙන 'Cannes Lions International Festival of Creativity' හිදී ශ්‍රී ලංකාව නියෝජනය කිරීමට නියමිත ය. අඛණ්ඩව 9වැනි වසරටත්, ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය (SLIM) සහ Metal Factor එක්ව සංවිධානය කරන ලද මෙවර තරගය සඳහා දිවයිනේ ප්‍රමුඛතම ආයතන නියෝජනය කරමින් දක්ෂ අලෙවිකරණ වෘත්තිකයින් කණ්ඩායම් 20ක් සහභාගී විය. මෙම කීර්තිමත් ජයග්‍රහණය නෙස්ලේ ලංකා සමාගමට හිමිවුණු තෙවැනි අවස්ථාව මෙය වීම ද විශේෂත්වයකි.

"මෙම ජයග්‍රහණය අපට විශාල ප්‍රීතියක් වගේම නිහතමානී ආඩම්බරයක්. අපේ රටේ දක්ෂතම තරුණ අලෙවිකරුවන් සමඟ තරඟකර ජයගැනීම සඳහා නෙස්ලේ ලංකා සමාගමෙන් අපට ලැබුණු අවස්ථා, ඉගෙනීම් සහ අත්දැකීම් බොහෝ සෙයින් ඉවහල් වුණා. ඒ වගේම, ශ්‍රී ලංකාව ගෝලීය මට්ටමින් නියෝජනය කිරීමට අවස්ථාව ලැබීම අපට ලැබුණු විශාල භාග්‍යයක්. මෙම වටිනා අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජන ගනිමින්, නෙස්ලේ ලංකා සමාගමට සහ ශ්‍රී ලංකාවට අභිමානයක් ගෙනදීමට අපි බලාපොරොත්තු වෙනවා", යනුවෙන් සමරිඳු විතාරණ (ජ්‍යෙෂ්ඨ සන්නාම විධායක - කිරි ආහාර අංශය) සහ මිනිඳු අලස් (සහකාර සන්නාම කළමනාකරු - මයිලෝ කිරි පිටි) පැවසූහ.

'Cannes Lions Young Marketer' තරඟය, දැන්වීම්කරණ සහ නිර්මාණාත්මක සන්නිවේදන ක්ෂේත්‍රය තුළ ඉහළම පිළිගැනීමක් හිමිකරගත් තරඟයක් ලෙස ප්‍රකට ය. එය, ගෝලීය දැන්වීම්කරණ වෘත්තිකයින්, නිර්මාණකරුවන්, ඩිජිටල් නවෝත්පාදකයින් සහ අලෙවිකරුවන්ගේ විශාලතම හමුව වන 'Cannes Lions International Festival of Creativity' හි කොටසකි. මෙම වාර්ෂික හමුව සඳහා ලොව පුරා සිටින වෘත්තිකයින් සම්බන්ධ වන අතර, එහිදී නිර්මාණාත්මක සන්නාම සන්නිවේදනය ඇගයීමටත්, ක්ෂේත්‍රය තුළ පවතින ගැටලු පිළිබඳ සාකච්ඡා කිරීමටත්, වෘත්තිකයින් අතර සුහදතාව වර්ධනය කරගැනීමටත් අපේක්ෂිත ය.

'Good Food, Good Life' සමාගම ලෙස ප්‍රකට නෙස්ලේ සමාගම ශ්‍රී ලංකාව තුළ වසර 115කට වැඩි කාලයක් පුරා ක්‍රියාත්මක වේ. ප්‍රජාව වෙත යහපත සැලසීමේ අරමුණින් කටයුතු කරන නෙස්ලේ ලංකා සමාගම, මෙරට තරුණ ප්‍රජාවට සිය උපරිම හැකියාව සහ

ධාරිතාව වෙත ළඟාවීම සඳහා සහාය වන විවිධ මුලපිරීම් ගණනාවක් ක්‍රියාවට නංවා ඇත.

---

**Contact:**

| | | | |
|---|---|---|---|
| Corp. Public Affairs | Damitha Kulatunga | +94777915949 | Damitha.Kulatunga@lk.nestle.com |